මාධ්‍යවේදී දරීෂා බැස්ටියන්ගේ ලැප්ටොප් පරිගණකය රහස් පොලිසිය භාරයට ගැනීම සහ එයින් පසු සිදුවීම් සම්බන්ධයෙන් වූ පුවත් වාර්තාවන් තවමත් දක්නට ලැබේ. කෙසේ නමුත් මෙම සෑම සියළු පුවතක්ම කෙතරම් නිවරදා ලෙසින් වාර්තා වී ඇත්දැයි යන්න ගැටළුවකි.

ඊට උදාහරණයක් ලෙසින්, පහත දිවයින පුවත දැක්විය හැක. මෙහි සිරස්තලය සඳහන් වන්නේ "ගානියා ප්‍රැසිස් සිද්ධියේ පරිගණකය මුදාහරින්නැයි කළ ඉල්ලීම ඉවතට" යනුවෙනි. ගානියා පැහැරගෙන යාමේ සිදුවීම තවමත් චෝදනාවක් පමණක් යැයි හඟවන දිවයින, එසේ නම් තවමත් පරීක්ෂණ පැවැත්වෙන මෙම ලැප්ටොප් පරිගණකය පිළිබඳ කාරණාව ගානියා ෆ්‍රැන්සිස් සිදුවීමට සම්බන්ධ වේ යැයි උපකල්පනය කරන්නේ කෙසේද?

එසේත් නැතිනම් මෙවන් ප්‍රකාශයක් සිදුකිරීම සඳහා වෙන යම් පදනමක් දිවයිනට තිබේද? එයින් පාඨකයා නොමග යැවීමක් සිදු නොවන්නේද? තවමත් පරීක්ෂණ පැවැත්වෙන, තහවුරු නොවූ කරුණක් තහවුරු වූ ලෙසින් දැක්වීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද? මෙහි සඳහන් වන එකදු කාරණාවක් සම්බන්ධව හෝ විශ්වසනීය මූලාශ්‍ර සැපයීමට අදාළ මාධ්‍යවේදියා සමර්ථ වී නොමැති බවද මෙසේම කිව යුතු වේ.

#Divaina #SinhalaPress #MediaEthicsSL